3477

සියලු ම හිමිකම් ඇවිරිණි /
முழுப் பதிப்புரிமையுடையது /
All Rights Reserved]

**04 S**

ශ්‍රී ලංකා විභාග දෙපාර්තමේන්තුව / இலங்கைப் பரீட்சைத் திணைக்களம் / Department of Examinations, Sri Lanka

## 2569 - දහම් පාසල් අවසාන සහතික පත්‍ර විභාගය - 2024 (2025)

## (04) බෞද්ධ සංස්කෘතිය

පැය තුනයි

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

- මෙම ප්‍රශ්න පත්‍රය කොටස් **හතරකින්** සමන්විත වේ. අවම වශයෙන් එක් කොටසකින් **එක් ප්‍රශ්නයක්වත් ඇතුළත්** වන සේ තෝරාගෙන ප්‍රශ්න **පහකට** පමණක් පිළිතුරු සපයන්න.

### I කොටස

**1.** (i) නිවන් මග හා සීලය අතර ඇති සබඳතාව පැහැදිලි කරන්න. සීලයට අයත් මාර්ගාංග නම් කරන්න. (ලකුණු 06 යි)

(ii) ශ්‍රාවක සංඝයා උදෙසා විනය ශික්ෂාපද පැනවීමේදී බුදුරජාණන් වහන්සේ අවධානය යොමු කළ අරමුණු අතුරින් හයක් ලියන්න. (ලකුණු 06 යි)

(iii) හිරි-ඔත්තප්ප පිළිබඳව වෙන් වෙන්ව හඳුන්වන්න. (ලකුණු 08 යි)

**2.** (i) සතරාකාර ප්‍රත්‍යවේක්ෂාව හඳුන්වා, එය පැවිදි සමාජයට වැදගත් වන ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(ii) ගිලානෝපස්ථානය බුදුරජාණන් වහන්සේ අගය කළ ආකාරය විස්තර කරන්න. (ලකුණු 06 යි)

(iii) ශිෂ්‍යයකු විසින් සිය ගුරුවරයාට සැලකිය යුතු ආකාරය බෞද්ධ ඉගැන්වීම් ඇසුරින් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

**3.** (i) පංසුකූල චාරිත්‍රයේ ඇති ආගමික, සාමාජික හා මනෝවිද්‍යාත්මක වටිනාකම් පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)

(ii) වස්කාලය හා කඨින චීවර පූජාව පිළිබඳ මූලික අවස්ථා ඇතුළත් වන සේ හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)

(iii) බෞද්ධ ශාන්තිකර්ම උදාහරණ සහිතව හඳුන්වන්න. එයින් එක් උදාහරණයක් මූලික අවස්ථා දක්වමින් විස්තර කරන්න. (ලකුණු 08 යි)

### II කොටස

**4.** (i) දාගැබක ගර්භයේ හැඩයේ ආකාරය අනුව ස්තූප නම් කෙරෙන අතර, ඒ අනුව දාගැබ නිර්මාණය කෙරෙන ආකාර හතරක් නම් කර, එයින් එකක් උදාහරණයක් සහිතව කෙටියෙන් හඳුන්වන්න. (ලකුණු 06 යි)

(ii) දාගැබක පවත්නා මූලික අංග පිළිවෙළින් නම් කරන්න. (ලකුණු 06 යි)

(iii) බෞද්ධ කලා නිර්මාණයක් වූ වටදාගෙය උදාහරණ සහිතව විස්තර කරන්න. (ලකුණු 08 යි)

**5.** (i) පැරණි බෞද්ධ සිද්ධස්ථානයකට පිවිසීම සඳහා ඇති දොරටුව ප්‍රධාන කලා අංග කිහිපයකින් සමන්විත ය. එම කලා අංග නම් කර, ඒවා පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 06 යි)

(ii) අනුරාධපුර යුගයේ සඳකඩපහණේ කැටයම් හා මෝස්තර මගින් අර්ථවත් වන බෞද්ධ දර්ශනය පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)

(iii) පොළොන්නරු යුගයේදී බෞද්ධ චිත්‍ර කලාවේ ව්‍යාප්තිය සිදු වූ ආකාරය උදාහරණ සපයමින් පැහැදිලි කරන්න. (ලකුණු 08 යි)

[ 2 වැනි පිටුව බලන්න.

6. (i) බුද්ධප්‍රතිමා නිර්මාණයේ ආරම්භය පිළිබඳ හැඳින්වීමක් කරන්න. (ලකුණු 06 යි)
(ii) පොළොන්නරු ගල් විහාරයේ හිටි පිළිමය පිළිබඳ විස්තර කරන්න. (ලකුණු 06 යි)
(iii) පටිමාඝර හෙවත් පිළිමගෙය නිර්මාණයේ අරමුණු පැහැදිලි කොට ගෙඩිගේ සම්ප්‍රදායට අයත් පිළිමගෙයි ආරම්භය හා සුවිශේෂත්වය පෙන්වා දෙන්න. (ලකුණු 08 යි)

## III කොටස

7. (i) 'සිවි මග හා බණ මග' පිළිබඳව උදාහරණ දෙමින් හඳුන්වන්න. (ලකුණු 06 යි)
(ii) පැරණි සිංහල සම්භාව්‍ය ගද්‍ය-පද්‍ය සාහිත්‍යයේ වස්තුවිෂය කෙරෙහි බුදුසමයේ බලපෑම පෙන්වා දෙන්න. (ලකුණු 06 යි)
(iii) කතුවරයා, ග්‍රන්ථය ලිවීමේ අරමුණ හා වස්තුවිෂය යන කරුණු අදාළ කරගනිමින් පූජාවලිය පිළිබඳව හැඳින්වීමක් කරන්න. (ලකුණු 08 යි)

8. (i) සාමාන්‍ය බෞද්ධ ගැමි ජනතාව අතර ප්‍රචලිත 'තුන්සරණය' කාව්‍ය ග්‍රන්ථය උදාහරණ කවි ඉදිරිපත් කරමින් හඳුන්වන්න. (ලකුණු 06 යි)
(ii) "පැරණි සිංහල පද්‍ය ග්‍රන්ථ රචනයේදී ජාතක කතා බෙහෙවින් පදනම් වී ඇත." උදාහරණ සහිතව මේ ප්‍රකාශය සනාථ කරන්න. (ලකුණු 06 යි)
(iii) "බෞද්ධයාගේ සිත්සතන් තුළ බුදුරජාණන් වහන්සේ පිළිබඳව ශ්‍රද්ධාව ජනනය කිරීමට බුදුගුණාලංකාර කතුවරයා සමත් වී ඇත." විමසන්න. (ලකුණු 08 යි)

## IV කොටස

9. (i) පුරාතන යුගය ලෙස සැලකෙන 10වන සියවස දක්වා වූ යුගය තුළ මියන්මාරයේ (බුරුම රට) බුදුදහම ආරම්භවීම හා ව්‍යාප්තවීම පිළිබඳව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
(ii) බුරුමයේ සීහළ සංඝනිකාය ආරම්භවීම හා ශ්‍රී ලංකාව සමඟ පැවැති සබඳතාව පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
(iii) බුරුම ජන ජීවිතය සකස්වීමෙහිලා බුදුසමයේ ආභාසය ලැබී ඇති අයුරු නිදසුන් මගින් පෙන්වා දෙන්න. (ලකුණු 08 යි)

10. (i) ක්‍රි.ව. 3වන සියවස දක්වා චීනයේ බුදුසමය ව්‍යාප්තවීම සිදුවූ ආකාරය පැහැදිලි කරන්න. (ලකුණු 06 යි)
(ii) චීන ජාතික හියුං සියැං හිමියන්ගේ සාසනික සේවාව අගයන්න. (ලකුණු 06 යි)
(iii) ක්‍රි.ව. 8වන සියවසෙන් පසු යුගය චීන බුදුදහම දේශීයකරණය වූ යුගය ලෙස සලකයි. මේ සඳහා බලපෑ හේතු සාධක පෙන්වා දෙන්න. (ලකුණු 08 යි)

* * *

PAST PAPERS WIKI

Downloaded From Past Papers WiKi - Sri Lanka's Largest Past Papers Library